# බුදුසමයේ පැනෙන අනුභූතිවාදී ප්‍රවණතාව

සිංගප්පූරුවේ බෞද්ධ හා පාලි විද්‍යාලයාධිපති
කොළඹ 12 ගුණසිංහපුර පූර්වාරාමාධිපති
ආචාර්ය පූජ්‍ය පාතේගම ඥානාරාම ස්ථවිර

බුදුසමයේ දක්නට ලැබෙන අනුභූතිවාදි ප්‍රවණතාව ලෝක ආගම් අතර බුදුසමයට ආවේණික විශිෂ්ට ලක්ෂණයක් ලෙස සලකනු ලැබේ. ගැඹුරු ලෙස බුදු දහම අධ්‍යයනය කළ පෙර අපර දෙදිග බොහෝ උගත්තු මෙම අනුභූතිවාදී ප්‍රවණතාව මෙන් ම එහි විශේෂත්වය ද අරබයා සිය අදහස් ප්‍රකාශ කර ඇත.

තමන් වහන්සේ විසින් දේශිත මාර්ගය අනුගමනය කිරීමෙන් කවරෙකුට වුව ද සත්‍යාවබෝධය කළ හැකි බව බුදුන්වහන්සේ දෙසූ සේක. එබැවින් එම ධර්මමාර්ගය වූකලී නුවණැත්තවුන් විසින් ප්‍රත්‍යෙක වශයෙන් අත්දැකීමෙන් හෙවත් ආනුභවික වශයෙන් ප්‍රත්‍යක්ෂ කළ යුත්තක් වශයෙන් හැඳින්වේ. (පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි) බුදු දහමේ මෙම ලක්ෂණය දෙස විචාර පූර්වක ව බැලූ ආචාර්ය හිරියන්න එතිසා මෙසේ කීවේය. "උන්වහන්සේගේ ධර්මය සාරාර්ථ වශයෙන් ගත්විට ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදත හැකි සියල්ලක් ප්‍රතික්ෂේප කරන ධර්මයක් වශයෙන් හැඳින්විය හැකි ය." යනුවෙනි.[1] අභ්‍යාස කළයුතු ප්‍රායෝගික ධර්මයක් වශයෙන් එහි ඇති වාස්තවික අගය තව දුරටත් අවධාරණය කරන ඔහු " සෛද්ධාන්තික කුතුහලයට උන්වහන්සේ හැමවිට ම දක්වන ලද්දේ නොකැමැත්තක් " බව ද ප්‍රකාශ කරයි.[2]

ආචාර්ය රාධාකෘෂ්ණන් , දේවධර්මය හා පාරභෞතික විද්‍යාව බැහැර කිරීමත් සදාචාරය කෙරෙහි නැඹුරු වීමත් බුද්ධදහමේ ප්‍රකට ලක්ෂණත්‍රයක් ලෙස දකිමින් එමගින් පිළිබිඹු කෙරෙන ආනුභූතිවාදි ස්ථාවරය විමර්ශනයට ලක්කර ඇත.[3] බුදුසමය පිළිබිඹු කරන මෙම ප්‍රවණතාව වඩාත් ව්‍යක්ත ලෙස ප්‍රකාශ කරමින් ආචාර්ය මෝර්ඩර් මෙසේ කියයි.

"තම කියමන් ආනුභවික ලෙස සත්‍යාක්ෂණය කරන මෙන් බුදුන්වහන්සේගේ විසින් ම අවධාරණය කර තිබුණි. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමය වූකලී වෛෂයික සංසිද්ධි ස්වාභාවික නියමයන් සමග එක්ව පැවතීමේ ප්‍රතිඵලයකි." යනුවෙනි. [4] තවදුරටත් ඔහු මෙසේ එය පැහැදිලි කරමින් සියලු කාල්පනික මතවාද හෙවත් දෘෂ්ටි බැහැර කළ බුදුන්වහන්සේගේ ප්‍රතීත්‍ය සමුප්පාදය පිළිබඳ අනුභූතිවාදී විස්තරයක් හා දුක නැති කිරීම පිළිබඳ මාර්ගයක් ද දෙසූ නිසා බුදුන්වහන්සේගේ ඉගැන්වීමෙහි පිළිඹිඹුවන අනුභූතිවාදී ස්ථාවරය මෙ මගින් පෙන්වා දිය හැකි බව කියයි. [5]

මුල් බුදු සමය ඉන්ද්‍රිය සංජානනය මෙන් ම අතීන්ද්‍රිය සංජානනය ද ප්‍රඥාලාභය පිණිස හේතුකාරක වශයෙන් පිළිගනී. එබැවින් ආනුභවික ඥානය සඳහා ඉන්ද්‍රිය සංජානනය මෙන් ම අතීන්ද්‍රිය සංජානනය ද පදනම් වන බව පිළිගැනීම බුදුසමයේ විශේෂත්වයයි. බුදුසමයේ යථෝක්ත ලක්ෂණය ප්‍රකට කරමින් ආචාර්ය ජයතිලක අවධාරණාත්මකව කරුණු දක්වා ඇත. මුල් බුදුසමයේදී සාමාන්‍ය හා අධි සාමාන්‍ය සංජානනයක් උද්ගාමී අනුමානයන් (අන්වයේ ඥාන) ඥාන මාර්ග වශයෙන් සලකන ලද බැවින් ඍජු සංජානාත්මක අනුභූතිය අගයන දහමක් වශයෙන් බුදු දහමට හිමි විශිෂ්ට ස්ථානය එහිදී අගය කෙරේ.[6]

දාර්ශනික ක්ෂේත්‍රයේදී අනුභූතිවාදය යනුවෙන් කුමක් අදහස් කෙරේදැයි විමසා බැලීම බුදුසමයේ පිළිබිඹු වන අනුභූතිවාදී ප්‍රවණතාව පිළිබඳ අවබෝධය සඳහා ප්‍රයෝජනවත් විය හැක.

ඉන්ද්‍රියානුභූතියට මුල්තැන දෙන අනුභූතිවාදය 17 වන සියවසේ එංගලන්තයේ ඇති වූ කාර්මික හා වාණිජ සංවර්ධනය නිසා බිහිවූවක් ලෙස සලකනු ලැබේ. භෞතික ලෝකය පාලනය කිරීමේ හැකියාව ගැන උනන්දුවී විද්‍යාවට අනුකූලවූ දර්ශනයක් ගොඩනැගීමේ අරමුණින් බේකන් හා ඔහුට පසුව **ජෝන් ලොක් ද** අප ලබාගන්නා ඥානය ඉන්ද්‍රියානුසාරයෙන් ම ලබා ගන්නා බව තක් කරමින් අනුභූතිවාදයේ පදනම දමා බටහිර දර්ශනයට අනුව නව චින්තන ප්‍රවාහයක් එකතු කළහ. [7] ඉන්ද්‍රියානුභූතියෙන් පරිබාහිරව කිසිම දැනුම් වෙහෙසක් නැතැයි කී ඔව්හු ඊට පෙර බුද්ධිවාදීන් ඉදිරිපත් කළ සහජ සංකල්ප පිළිබඳ අදහස ඉඳුරා





ප්‍රතික්ෂේප කළහ. එබැවින් අනුභූතිවාදය ඥානමීමංසාතිමත සිද්ධාන්තයක් වශයෙන් සලකනු ලබන අතර පුද්ගලයා ලබන ඥානයන්ගේ මූලාශ්‍රය වශයෙන් අනුභූතියට එ මගින් ප්‍රමුඛත්වය හිමිකර දෙනු ලැබිණි. වෙනත් අයුරකින් කියතොත් ඥානය අනුභූතිය පදනම් කොට ඇතිවන බව ඉන් කියවේ. එබැවින් මනසෙහි පවත්නා සංශ්ලේෂිත සකල ඥානසන්ධාරයම අනුභූතිවාදීව පහල වූවක් ලෙස සලකනු ලැබේ.

බුදුන්වහන්සේගේ ඉගැන්වීම් සමුදාය අනුභූතිවාදී පදනම මත පිහිටා ඇත්තේ කවර ආකාරයකින්දැයි මෙහි දී අප විසින් සොයා බැලිය යුතු වේ. ඉන්ද්‍රිය මගින් ලබාගන්නා ඥානය මෙන් ම ඉන්ද්‍රිය විෂය ඉක්ම වූ අතීන්ද්‍රිය ඥානය ද මුල් බුදුසමයේ ඉගැන්වෙන අනුභූතිවාදයට යටත් වේ. බෞද්ධ ඉගැන්වීම් වූකලී පාරභෞතික සිද්ධාන්තයක් හෝ ශ්‍රැතිය ගුරුකොටගත් අධිකාරියක් හෝ ප්‍රාගානුභූත දහමක් හෝ නොව ආනුභූතික ව සාක්ෂාත් කළ ඥානයක් සත්‍යාක්ෂණය කළ හැකි උපන්‍යාසයක් වශයෙන් දෙසූ දහමකි. සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මීමට තුඩුදුන් පෙරනිමිති දැකීමේ පටන් සත්‍යාවබෝධය ලබාගන්නා තුරු උන්වහන්සේ විසින් ලබන ලද අත්දැකීම් සම්භාරය වූ කලී, අනුභූතිය පදනම් කොට ඇති වූ ඒවා ය. රෝගී වීම, මහළු වීම, මරණයට පත්වීම, ඉච්ඡාභංගය ආදී දෛනික ජීවිතයේ දී ආනුභවික පුද්ගලයා වැටී ඇති දයනීය තත්වය දෙස බලත් ම එය ආනුභවික සත්‍යයක් ලෙස එතුමාට වැටහුණි. මේ අනුව සිතත් සිතත්ම උන්වහන්සේගේ සිත තදින්ම කැළඹී ගියේ ය. පැවිදිරුව දකිත් ම අභිනිෂ්ක්‍රමණය පිළිබඳ සිතන්නට විය. කිං කුසල ගවේෂීව සිටි සා අවුරුදු කාලයේ දී ආළාරකාලාමගෙන් ආකිඤ්චඤ්ඤායතනය තෙක් සිත දියුණුකර ගැනීමට ඉගෙනීමෙන් උද්දකරාම පුත්තගෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් සිත දියුණු කර ගැනීමට ඉගෙනීමත් උන්වහන්සේ ගුරු ඇසුරින් එසමයේදී ලබාගත් අනුභූතීන් විය. අරිය පරියෙසන හා මහාසීහනාද යන සූත්‍රවලදී මෙම අත්දැකීම් මැනවින් විස්තර කර ඇත.

ආසෝක (ශෝක නැති) අමත (මරණය නැති) අසංකිලිට්ඨ (කිළුටු නැති) උත්තරීතර තත්වයට පත්වීම පිණිස එවක ආජීවකයන් හා ජෛනයන් විසින් භාවිත කළ විවිධ චර්යා උන්වහන්සේ භාවිත කළහ. මෙම චර්යාවන් අතර තපස්සී නමින් හැඳින්වෙන උග්‍ර තවුස් දම්හි යෙදෙන , ලූඛ නමින් හැඳින්වෙන මිනිස්වග පිළිකුල් කරන, පවිවිත්ත

නමින් හැඳින්වෙන ප්‍රකර්ෂ විවේකය අගයන, තවුසෙක් ව සා අවුරුදු දුෂ්කර ක්‍රියා සමයේදී උන්වහන්සේ තවුස්දම් රැකි ආකාරය යථෝක්ත සූත්‍රවලදී දැකිය හැක. පරම අවිහිංසා වාදී ව ඉතා කුඩා ප්‍රාණියෙකු පවා පයට පෑගී නොමියේවායි සිහියෙන් යුක්ත ව දිය බිඳුවක් කෙරෙහි පවා දයාන්විතව ජීවත් වෙමින් යාම් ඊම් කළ සැටිත් උන්වහන්සේ ප්‍රකාශකරති.[10]

යඥයෙන් ශුද්ධිය **(යඤ්ඤෙන සුද්ධි)** අපේක්ෂාකර යාගයෙහි යෙදීමෙන් ආහාරයෙන් ශුද්ධිය **(ආහාරෙන සුද්ධි)** අපෙක්ෂාකර උපවාසයෙහි යෙදීමෙන් යන දෙකින් ම ලබන ලද්දේ ඒවා නිෂ්ඵල ප්‍රයත්නයන්ය යන අනුභූතිය පමණකි. ඒ කිසිවකින් උතුම් ඥාන විශේෂයක් ලබා ගැනීමට නොහැකි විය.[11] ඇදුරන් හමුවීමට පෙර ද උන් වහන්සේ විවිධ යෝග ක්‍රම භාවිත කළහ. මහා **සච්චක සූත්‍රයේ** ඒ පිළිබඳ විස්තර සඳහන් වේ. මේ හැමෙකකින් ම ලබන ලද්දේ සියල්ල නිෂ්ඵල අභ්‍යාසයන්ය යන අනුභූතිය පමණකි. [12]

එකල උත්තර භාරතයේ සිටි මෙලොවදීම තමන් අභිඥාවන්ගේ පරතෙරට පත් ව සිටිතියි ආදි බ්‍රහ්මචරිය පිළිත කරන තෙකොටසක් ගැන පවසා අන්‍යොන්‍ය වශයෙන් ඔවුන්තර පවත්නා වෙනසක් (වෙමත්තකං) සංගාරව සූත්‍රයේදී බුදුන්වහන්සේ විසින් දේශනා කොට ඇත. [13]

1. ශ්‍රැතිය අධිකාරයෙන් ගත් තෙවිජ්ජ බ්‍රාහ්මණයෝ (තෙවිජ්ජා බ්‍රාහ්මණා)
2. හුදු ශ්‍රද්ධාමාත්‍රයෙන් යුත් තර්කග්‍රාහී වීමංසක මහණ බමුණෝ **(තක්කී වීමංසී)**
3. පෙර නොඇසූ විරූ ධර්මයන් තමන්ම දැන ප්‍රකාශ කරන්නෝ **(සාමඤ්ඤෙව ධම්මං අභිඤ්ඤාය)**

මෙයින් තමන් වහන්සේ තෙවන ගණයට වැටෙන බව බුදුන්වහන්සේ කීහ. බහුවිධ තපස් චර්යාවන් අත්හදා බැලූ දුෂ්කර ක්‍රියා සමයේදී තමන් වහන්සේ කාලය ගෙවූ අයුරු අනතුරුව මෙම සූත්‍රයේදී විස්තර කෙරේ.

ආළාර කාලාම හා උද්දකරාමපුත්ත ඇදුරන් ගැන කීමේ දී





තමන් පිළිත කරන ධර්මය දනිමින් **(ජානං)** දකිමින් **(පස්සං)** ඔවුන් වාසය කළ බවත් එබැවින් තමනුත් එම තත්ත්වයට පත්වීම පිණිස වීර්ය වැඩූ බවත් බුදුන්වහන්සේ විසින් ප්‍රකාශ කරන බැවින් ඔවුන්ගේ ඉගැන්වීම හුදු සෛද්ධාන්තික ඉගැන්වීමක් නොව අභ්‍යාසයෙන් ලබාගත් අනුභූතිමය ඥානයක් බව ප්‍රකට වේ. එබැවින් මෙම ආචාර්යවරුන් දෙදෙනාද අනුභූතිවාදීන් බව නිගමනය කළයුතු වේ. එම අභ්‍යාසයන් හි යෙදී සිදුහත් තවුසාණන් විසින් ද එකී අධ්‍යාත්මික තත්ත්වයන් ලබාගන්නා ලදී. ගුරුවරුන්ගෙන් බැහැර වූ පසු තමන් විසින් අනුගමනය කරන ලද රූක්ෂ ප්‍රතිපදාවන් තව දුරටත් මෙම සූත්‍රයේ විස්තර වේ.

දත්මිටි කමින් දිවෙන් තල්ල ගටා කුසල් සිතෙන් අකුසල් සිත දැඩිසේ නිගන්නෙමි, පෙළෙන්නෙමි, නවන්නෙමි මැනවැයි (චිත්තෙන චිත්තං අභිනිග්ගණ්හෙයාං අභිනිප්පීලෙයාං අභිසන්තාපෙයයාං) සිතා එසේ කළේ ය. ඉක්බිති නිරාශ්වාස ධ්‍යානය (අප්පාණකං ඣානං ඣායෙයාං) වැඩීය. මුළුමනින් ආහාරයෙන් වැළකුණේය. (සබ්බසො ආහරූපච්ඡේදාය පටිපජ්ජෙයාං) ඉන් පසු ටිකෙන් ටික ආහාර ගැනීමට පටන්ගනී. (ථොකං ථොකං ආහාරං ආහරෙයාං) ඉන් පසු ටිකෙන් ටික ආහාර ගැනීමට පටන්ගති. (ථොකං ථොකං ආහාරං ආහාරෙයාං) අනතුරුව ඔළාරික ආහාර වැළඳීමට පටන් ගති. (ඔළාරිකං ආහාරං ආහරෙයාං) මේ කාලය තුළ උන්වහන්සේ විසින් විඳින ලද ඖපක්‍රමික දුක් (ඔපක්කමික දුක්ඛා) අතීත වර්තමාන අනාගතය යන තුන් කාලයටම අයත් කිසිදු ශ්‍රමණයෙකු හෝ බමුණෙකු හෝ අත් දකිනු නොලබන බැවින් ශාරීරික වශයෙන් තමන් තුළ සිදු වූ වෙනස්කම් ද උන්වහන්සේ විස්තර කර ඇත.

ඉක්බිති ධ්‍යාන විස්තරය අනු පිළිවෙලින් වැඩූ සැටිත් අනතුරුව පූර්වෙනිවාසානුස්මෘතිඥානය , ච්‍යුතූපපාතඥානය හා ආශ්‍රවක්ෂකර ඥානය ලබා දුක්ඛ සමුදය නිරෝධ මාර්ග යන චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් යුතු ව කාම. භව , අවිද්‍යා , ආශ්‍රවයන් නසා විමුක්තිය සාක්ෂාත් කළ අයුරුත් දැක්වේ. විමුක්තිය සාක්ෂාත් කළ කල්හි "මිදුනෙමි'යි නුවණ පහළ වූ අතර 'ඉපදීම' අවසන් ය. බඹසර වාසය කරන ලදී. කළ යුත්ත කරන ලදී. මින්මතු අන්කිසිවක් නැතැයි දැනගතිමි'යි උන්වහන්සේ සංගාරවට ප්‍රකාශ කළහ.

සත්‍යාවබෝධය සඳහා අනුගත පිළිවෙතක් වේ. "එක්වරම කෙලෙස්ප්‍රහාණ ඥානය (අඤ්ඤා) ලැබේයැයි මම නොකියමි. එහෙත් ."

අනුපූර්ව ශික්ෂාවක් ක්‍රියාවක් හා අනුපූර්ව ප්‍රතිපදාවක් ඇත. යනුවෙන් වදාළේ එබැවිනි.[14] පළමු කොට ආර්ය ශීලස්කන්ධයෙන් සමන්විත වූ ඔහු ක්‍රමයෙන් සිත දියුණු කරගැනීමට නැඹුරුවිය යුතුවේ.[15] පරම නිෂ්ඨාව සාක්ෂාත් කිරීම සඳහා එය මාර්ගය වේ. "(සත්‍යක්ෂණ) ප්‍රතිපදාව අනුව යාමෙන් ශ්‍රාවකයන් ආශ්‍රවක්ෂය කිරීම සංඛ්‍යාත අනාශ්‍රව නම් වූ චෙතොවිමුත්තිය හා පඤ්ඤා විමුක්තිය මේ ජීවිතයේදීම මැනවින් දැන සාක්ෂාත් කොට වාසය කරති." යනුවෙන් මහා සකුළුදායි සූත්‍රයේ සඳහන් වීමෙන් මේ බව පැහැදිලි වේ.[16]

බුදුන්වහන්සේ අවශේෂ ලෝකයාගේ සම්භවනාවට පත්වීමට හේතු වූ කරුණු මහාසකුලුදායි සූත්‍රයේ සංග්‍රහ කොට දක්වා ඇත. ඉන් ගම්‍යමාන වන්නේ ද බුදුන්වහන්සේගේ ඉගැන්වීමෙහි දක්නට ලැබෙන අනුභූතිවාදී ප්‍රවණතාවය. උන්වහන්සේ සම්භාවනාවට පත්ව ඇත්තේ එම ප්‍රවණතාව නිසා බව ය.

බුදුන්වහන්සේගේ අධිශීලය හා අධිප්‍රඥාවට අමතර ව එහිදී උන්වහන්සේ සතු ඥානදර්ශනය ගැනත් එම ඥානදර්ශනාවෙහි විශේෂ ස්වභාවය ගැනත් කියවේ. උන්වහන්සේ දනිමින් **(ජානා)** දකිමින් **(පස්සං)** අවබෝධයෙන් **(අභිඤ්ඤාය)** හේතු සහිතව **(සනිදානං)** සකාරණම **(සප්පටිහාරියං)** ධම්ය දේශනා කර බව එහි දැක්වේ. එබැවින් සාකල්‍යයෙන්ම එම ධම්ය වූකලී ආනුභවික ඥානය පදනම් කරගත් ආනුභූතික ඥානදර්ශනයකි. තමන් වහන්සේ විසින් නිර්දිෂ්ට මාර්ගය අනුගමනය කිරීමෙන් ශ්‍රාවකයන් සතර සතිපට්ඨාන , සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රිය, ආදිය වඩන අයුරු අනතුරුව දීර්ඝ වශයෙන් එහි විස්තර වන අතර අවසානයේ දී විමුක්තිය සාක්ෂාත් කරන අයුරු කියවේ.

නිර්වාණය වාස්තවික සත්තාවක් නොවේ. එය අනුභූතිවාදීව විස්තර කළ නොහැකි අතර ඉන්ද්‍රියානුභූතිය ඉක්ම වූවක් බැවින් එය අධිගම කළ යුත්තක් බව ආචාර්ය ජයතිලක පෙන්වා දෙයි.[17] සොපාධිසෙස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන ශ්‍රාවකයා සත්‍යාවබෝධයෙන් පසුව ද ජීවත් වෙයි. එහෙත් සත්‍යක්ෂණ මාර්ගය අනුගමනය කිරීමෙන් තමා විසින් ලබා ඇති අනුභූතිය තර්කය මත ගොඩනැගුණු ලෝකව්‍යවහාරය හෙවත් භාෂාව උපයෝගීකර ගනිමින් විස්තර කළ නොහැකි අනුභූතියක් බව අවබෝධ කර ගනියි. පාර භෞතික කරුණු ය





වලින් තොරවීමත් ආනුභවික වශයෙන් සත්‍යක්ෂණය කළ හැකිවීමත් බුදුන්වහන්සේගේ දර්ශනයේ විශේෂත්වය වශයෙන් සැලකීමට එය බාධාවක් නොවේ.[18] අර්හත්වය සාක්ෂාත් කළ පුද්ගලයා ප්‍රඥප්තිගත කළ නොහැකි බැවිනි. "නිර්වාණාවබෝධය කළ තැනැත්තා මැනිය නොහැක. වාග් ව්‍යවහාරයෙන් ප්‍රකාශනීය බවක් ඔහු පිළිබඳව නැතැ"යි සුත්ත නිපාතයේ දැක්වේ.[19] මේ පිළිබඳව තර්කානුසාරී වාග් ව්‍යාපාර මගින් ප්‍රකාශ කිරීම වැරදි අර්ථ කථනයන්ට හේතු වේ. නිර්වාණය පරම සැපතක් බවත් රහතන්වහන්සේ මොලොවදීම එම නිවන්සුව විඳින බවත් භාෂාව උපයෝගී කොට ප්‍රකාශ කළ ද එය අනිර්වචනීය අනුභූතියක් බව පැහැදිලි ය.

සැරියුත් මාහිමියන් හා උදායි හිමියන් අතර පැවති කෙටි සංවාදයක් අංගුත්තර නිකායේ එයි. වේළුවනයේ දී වරක් භික්ෂූන් ඇමතූ සැරියුත් මාහිමියෝ මෙසේ කීහ.

"මේ නිර්වාණය ඇවැත්නි ; සැපයකි. මේ නිර්වාණය ඇවැත්නි සැපයකි."

මෙසේ කී කල්හි ආයුෂ්මත් උදායි තෙරණුවෝ සැරියුත් මාහිමියන්ට මෙසේ කීහ.

"ඇවැත්නි , සැරියුත් මාහිමියනි, විඳිය යුතු යමක් නොවේ නම් මෙහි සැපයක් වන්නේ කෙසේද?"

"මෙහි විඳිය යුතු යමක් නොවීම සැපයකි." යනු සැරියුත් මාහිමියන්ගේ පිළිතුර විය.[20]

සැපය වින්දනයක් වශයෙන් සිතාන්නට පුරුදු වූ ලෞකික බුද්ධියට එය ගෝචර නොවුව ද එය අනිර්වචනීය පුද්ගල අනුභූතියක් වශයෙන් සැලකුව මනාය.

සත්ත්වයාගේ සංසාරික ආරම්භය ගැන කීමේ දී බුදුන්වහන්සේ භික්ෂූන්ට වදාළේ

"අනමතග්ගො අයං භික්ඛවෙ සංසාරො පුබ්බකොටි

නපඤ්ඤායති" යනුවෙනි.[21] මෙහි අනමතග්ග යන්න විවිධාකාරයෙන් තේරුම්කරනු ලැබ ඇත. "පුබ්බාකොටි න පඤ්ඤායති" යන පසු අර්ධයෙන් පැහැදිලි ව දැක්වෙන්නේ "මුල් කෙළවර පැනෙන්නේ නැත" යනුයි. " නොපිරිසිඳ දක්නා ලද අක්මුල් ඇති" යයි අටුවාව අරුත් දෙයි.[22] "යම් හෙයකින් මුල් කෙලවර නොපැනේ ද එමෙන් ම පැසුළු කෙළවර ද නොපැනේ. මැද සත්ත්වයෝ හැසිරෙති." යනුවෙන් සංසාරයෙහි මුල අග දෙක ම නියම කොට දැක්විය නොහැකියි මින් කියවෙන බව සංයුක්ත නිකාය අටුවාව තව දුරටත් කියයි. **අනු + අමත + අග්ගෝ** යනුවෙන් මෙම වචනය ද විසන්ධි කරයි.

බෞද්ධ සංස්කෘතියේදී මෙය ලැබිය යුත්තේ "අනමතාග්‍ර" යනුවෙන් වුවත් සඳහන් වන්නේ "අනවරාග්‍ර" යනුවෙනි. එබැවින් එය (අන් + අවර + අග්‍ර) යනුවෙන් විසන්ධි කළ හැක. "අක් මුල් නැති සසර" හෙවත් ආරම්භයක් කෙළවරක් නොපැනෙන සසර වශයෙන් අනවරාග්‍ර යන්නට අර්ථ කියා ඇති වුවත් එම අර්ථය ද කොතෙක් දුරට නැඹුරුදැයි ප්‍රශ්නයක් උපදියි.[24]

**"අනමතග්ග"** යන්න සඳහා නොයෙක් උගතුන් විසින් විවිධ නිරුක්ති දක්වා ඇත. විල්ඩර්ස් මෙය අන් + අමත + අග්ග යනුවෙන් විභාගකොට මන් ධාතුවෙන් නිපන්නක් යයි කියයි. එහෙත් ජාකෝබි හා පිශ්ටෙල් යන දෙදෙනා එය අ + නමත් + අග්ග යනුවෙන් විසන්ධි කොට නම් ධාතුවෙන් නිපන්නක් ලෙස දක්වති. වේබර් මෙහි අන් + ආමෘත යන්නෙන් බිඳී ආවක් ලෙස දක්වන අතර "මෙහි අර්ථය මැනවින් දත හැක්කේ සංයුක්ත පාඨයේ සංදර්භය අනුව මිස නිරුක්ති නයින් නොවේ." යයි කියා ස්ටෙඩ් නිරුක්තිය දැක්වීමෙන් වළකියි.[25] අනවරාග්‍ර යන්න අටුවා කරන හැම නිකායක්ම වාගේ සාමාන්‍යයෙන් (මුල පමණක් නොව) අගක් නොමැති යන අර්ථය ද මීට දීමට යුහුසුළු වෙයි. "සංසාර සංසරණය කිසියම් අයෙකුට සාකල්‍යයෙන්ම කෙළවරක් නැත්තක් වුවත් නිර්මාණය කෙළවරය යන අරුත ද මෙහි ඇතැ"යි චෝල්ඩර් කියයි.[26]

"අනමතග්ග" යන්න සසර අක්මුල් නැත්තක් යයි වාච්‍යවන්නක් ලෙස ගන්නා ජයතිලක මෙයින් අනුභූතිවාදයේ සීමාවක් පෙන්නුම් කෙරෙතැයි අදහස් කරමින් මෙසේ කියයි." අප පාලි නිකාය කෘතිවලට සීමාවුවහොත් එහි අනුභූතිවාදයේ සීමාවක් සඳහන් වන බවත් ා





ආනුභවික පරීක්ෂණයෙන් මේ ප්‍රශ්නය අරඹයා සත්‍යය දත නොහැකි බව පිළිබඳ පිළිගැනීමක් පැවති බවත් " කියයි. දශ අව්‍යාකෘතවල සඳහන් වන ලෝකය අන්තවත්ද? අනන්තවත්ද? යන ප්‍රශ්න අරඹයා බුදුන්වහන්සේගේ නිශ්ශබ්දතාව පැහැදිලි කිරීමේ දි ජයතිලක මහතා ලෝකය , සංසාරයත් සමඟ එකට ගැනීම නිසා මේ පැටලවීම සිදු වී ඇත.[27] වෛෂක ලෝකය අන්තවත් වුවත්, අනන්තවත් වුවත්, සංසාරයට බැසගත් පුද්ගලයා පිළිබඳ කථා කිරීමේ දී එය ඊට සම්බන්ධ නොවේ. ආනුභවික ලෝකය සීමා සහිත හෝ සීමාරහිත වුවත් එය සසරට අදාල නැත.

බුදුන්වහන්සේ විසින් වදාළ අනමතග්ග සූත්‍රයේ එන යථෝක්ත වචනය අන් + අ + මත + අග්ග වශයෙන් විසන්ධි කොට මන් ධාතුවෙන් නිපන් වචනයක් ලෙස ගත හැකි ය. මෙහි නිෂෙධාර්ථවාචක උපසර්ග දෙකක් යෙදීමෙන් අස්ථ්‍යර්ථයක් ලැබේ. " නොසිතන ලද්දේ නොවන" "හෙවත්" "සිතන ලද (පරිකල්පනය කරන ලද) කෙළවර ඇති" යන අරුත එවිට ලැබේ. එවිට "සසර කෙළවර පිළිබඳ ව (නිර්වාණය ගැන) සිතන ලද්දේ වුවත් මුල් කෙළවර පැනෙන්නේ නැත." (පුබ්බාකොටි න පඤ්ඤායති) යනුවෙන් අර්ථ බිණිය හැක. " අනවරාග්‍ර" යන්නෙන් (අන් + අවර + අග්‍ර) " අවරාග්‍ර හෙවත් යට කෙළවර නැති හෙවත් නොපැනෙන යන අරුත දැක්වෙන ලෙස ගත හොත් ඉන් ගම්‍යවන්නේ " පුබ්බාකොටි න පඤ්ඤායති" යන්නෙහි අර්ථයමය . මේ නයින් සැලකුව හොත් පාලියෙහි අනමතග්ග යන්නෙන් සසර අග කෙළවර විඳින වුවත් ලෙස දක්වා ඇති අතර බෞද්ධ සංස්කෘතියේ දී අනවරාග්‍ර මුල් කෙළවර හෙවත් පසු කෙළවර අත්විඳිත වූවක් ලෙස දක්වා ඇති බව කිව යුතු වේ. එබැවින් අවිද්‍යාව නීවරණ කොට ඇති තෘෂ්ණාව සංයෝජන කොට ඇති සසර දිවෙන සැරිසරන සත්වයන්ගේ (අවිජ්ජා නිවරණානං සත්තානං තණ්හා සමයෝජනානං සන්ධාවතං සංසරතං) මුල් කෙළවර නොපැනේ. අග කෙලවර දන්නා ලද්දේ මේ යනුවෙන් අර්ථ පැහැදිලි කර ගත හැක.[28]

බුදුන්වහන්සේ පාරභෞතික විශ්වයක් ප්‍රතික්ෂේප කරන ලද බැවින් සංසාර සංසරණය අනන්ත කාලයක සිට සිදුවන්නක් බව ප්‍රකාශ කිරීම ආනුභවික ගවේෂණයක් බවත් එබැවින් එය අපගේ බසින් කියතොත් විද්‍යාත්මක කියමනක් බවත් ආචාර්ය **චොර්ඩර්** ඉඳුරා ප්‍රකාශ කරයි.[29] යමක් නොපැනේ යයි යමෙකුට කිව හැකි වන්නේ එය අනුභූතියට ගොචර වූ නිසා නොවේ ද? අනුභූතියට ගොදුරු නොවූයේ නම් කිව යුතු වන්නේ කිසියම්

අධිකාරණයකට සම්බන්ධ කිරීම හෝ තමාට එය සිතා මතා ගැනීමට අපහසු බව නොවේ ද? එ නිසා මෙය අනුභූතිවාදයේ සීමාව පෙන්නුම් කරන්නක් නොව එය ආනුභවික ස්ථාවරය මත සිට කරන ලද ප්‍රකාශයක් වශයෙන් පිළිගත යුතු ය.

බුදු දහමේ මේ මූලික ඉගැන්වීම් වශයෙන් සැලකෙන හේතුඵලවාදය ත්‍රිලක්ෂණය වැනි ඉගැන්වීම් ද අනුභූතික සත්තාවක් ලෙස පිළිගැනේ.

"තථාගතවරු උපන්නත් නැතත් ඉපදීම ප්‍රත්‍යය කොට ජරාමරණ වේ යන අනුක්‍රමය, ප්‍රපඤ්ච ස්ථිතිය , ප්‍රපඤ්ච රටාව, ප්‍රතීත්‍ය සමුත්පන්නව ලොව පවතී. එය තථාගතවරු අවබෝධ කරති. සොයා ගනිති. අවබෝධ කොට සොයාගෙන පෙන්වා දෙති. දෙසති , පණවති, පිහිටුවති , විවරණය කරති. බෙදා දක්වති, එළිදරව් කරති , 'බලව්' යයි කියති" යන මෙයින් ප්‍රකට කෙරෙන්නේ ද හේතුඵලවාදී බෞද්ධ ඉගැන්වීමෙහි දක්නට ලැබෙන අනුභූතිවාදී ප්‍රවණතාවය.[30] **අනත්ත ලක්ඛණ සූත්‍රයේ දී ද** ත්‍රිලක්ෂණය සමර්ථනය කරනු පිණිස අනුභූතිවාදී ස්ථාවරය මත කෙරෙන විවරණයක් අපට දැකිය හැකි ය.

එහිදී ස්කන්ධ පඤ්චකයෙහි එකිනෙක බැගින් ගෙන එය නිත්‍යද? අනිත්‍යදැයි? බුදුන්වහන්සේ පස්වග මහණුන් විචාරති. සදාකාලික වශයෙන් ඒවා නොපවතින බැවින් අනිත්‍ය බව පස්වග මහණුන් කියති. යමක් අනිත්‍ය නම් එය සැපයක් ද? දුකක්දැයි උන්වහන්සේ අනතුරුව ප්‍රශ්න කරති. එය සැපයක් ලෙස පිළිගැනීමට නොහැකි බැවින් පස්වග මහණහු එය දුක් බව පිළිතුරු වශයෙන් කියති. යමක් අනිත්‍ය නම් දුක නම් විපරිණාමීය ස්වභාවයෙන් යුක්ත නම් - ඒ මම ය ඒ මාගේ ය ඒ මාගේ ආත්මය ය යනුවෙන් දැකීම යෝග්‍යදැයි අනතුරුව ප්‍රශ්න කරති. එසේ දැකීම යෝග්‍ය නොවන බව පස්වග මහණහු පිළිතුරු වශයෙන් කියති. [31]

මේ නිසා අනිත්‍ය දුක්ඛ අනාත්තමය යන සංස්කාරයන්ට පොදු ලක්ෂණ ත්‍රය සමර්ථනය කෙරෙන්නේ ආනුභූතික පදනම මතය. ඉන්ද්‍රිය ගොචර සත්තාවක් ලෙස මෙම ලක්ෂණත්‍රය අර්ථවත් කෙරෙන බැවින් බුදුදහම යථාභූත ඥාණය කෙරෙහි නැඹුරු වී ඇතිබව මැනවින් පැහැදිලි වේ.





මේ නයින් සළකන විට හේතුඵලවාදය හෝ ත්‍රිලක්ෂණය වැනි ඉගැන්වීම් හෝ ප්‍රාගානුභූත සත්තාවන් නොව සත්‍යක්ෂණය කළ හැකි ආනුභූතික සත්තාවන් වශයෙන් හඳුනාගත යුතු බව කිවයුතු වේ.

**පාදක සටහන්**

01. ඇම් හිරියන්න - **සංක්ෂිප්ත ඉන්දිය දර්ශනය** 118 පිටුව
02. - එම - - - එම - 119 පිටුව
03. සර්ව පල්ලි රාධාකෘෂ්ණන්- **ඉන්දිය දර්ශනය I** 302 පිටුව
04. A.K. Warder - **Indian Buddhism** P - 300
05 OP. cit - P 377
06. K.N. Jayatilleke - **Early Buddhist Theory of Knowledge P.**
07. හොබ්ස් , බර්ක්ලේ හා හියුම් ආදීහු අනුභූතිවාදී දාර්ශනිකයන් හැටියට සැළකෙති. බලන්න , බර්ට්‍රන්ඩ් රසල් - **බටහිර දර්ශන ඉතිහාසය**
08. ම.නි. I 162 පිටුව
09. ම.නි. I 69 පිටුව
10. **සනොච අභික්කමාමි සතෝච පටික්කමාමි යාච උදබින්දුම්හි මෙ දයා පච්චුපට්ඨිතා හොති මාහං ඛුද්දකෙ පාණෙ විසමගතෙ සංඝාතං ආපාදෙස්සන්ති.** ම. නි. 1 78 පිටුව
11. ම. නි. - 1 80 පිටුව
12. **කාය ඉරියාය තායපටිපදාය තාය දුක්කරකාරිතාය නාපඣගමං අලමරිය ඤාණදස්සන විසෙසං** ම. නි 1 81 පිටුව
13. ම. නි. 1 80 පිටුව
14. **නාහං ආදිකෙනෙව අඤ්ඤාරාධනං වදාමි අපිච අනුපුබ්බ සික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බ පටිපදා** ම. නි. 1 479 පිටුව
15. අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො - ම. නි. 1 346 පිටුව
16. ම. නි. 11 2 පිටුව
17. කේ.එන්. ජයතිලකගේ ඉහත සඳහන් කෘතිය 475 පිටුව
18. ආචාර්ය ඩී. ජේ. කලුපහන තමාගේ Buddhist Philosophy කෘතියේදී මෙසේ කියයි. " තමාගේ මුල් බුදුසමයේ ඥාන මීමංසා සිද්ධාන්තය නැමැති කෘතියේදී මුල් බුදු සමය අනුභූතිවාදී ඉගැන්වීමක් බව සනාථ කිරීමටත් එය ආනුභවික වශයෙන් සත්‍යක්ෂණය කළ නොහැකි පාර භෞතික කරුණු වලින් තොර වූ දහමක් බවත් කියා පෑමට ජයතිලක බලවත් පරිශ්‍රමයක් දැරුව ද බටහිර උගතුන් හා හින්දු හා ඈත පෙරදිගඋගතුන් විසින් කරන ලද විවරණ බාහුල්‍යය නිසා ආනුභවිකව විස්තර කිරීමට හෝ අවබෝධ කිරීමට හෝ නොහැකි එහෙත් (මරණින් පසු) අධිගම කළයුතු අනුභූති උත්තර සත්තාවක් ගැන කියා ඇතැයි" කියයි. වරහන් ඇතුලත ඇති මරණින් පසු යන්නත් මරණය එම උධෘතයේ මුල් ජේදයේ නොහැක. කලු පහන වැරදි ලෙස ජයතිලක උපුටා දක්වා ඇති අතර නිගමන මරණින් පසු සාක්ෂාත් කළ යුත්තක් ලෙස ජයතිලක දක්වා නැත.
බලන්න D.J. Kalupahana - **Buddhist Philosophy** P. 87
K. N. Jayatilleke - **Early Buddhist theory of Knowledge** P. 475

19. අත්ථංගතස්ස න පමාණ මත්ථියෙන තං වජ්ජු තං තස්සනත්ථි
- සුත්ත නිපාත 1076
20. එතදෙව බො එත්ථ ආවුසො සුඛං යදිඑත්ථ නත්ථි වෙදයිතං - අං. නි. නවම නිපාත
21. සං. නි. 11 178, 187
22. අනමතග්ගෝති අනු අමත අග්ගො නාස්ස සක්කා ඉතොවා එතෙතා වා අග්ගං ජානිතුං අපරිච්ඡින්න පුබ්බාපර කොටිකෝති අත්ථො. සාරත්ථප්පකාසිනි (සං. හේ. මු.) 11 117 පිටුව
23. යදග්ගෙන වස්ස පුරිමාකොටි න පඤ්ඤායති. පච්ජිමාපි තදග්ගෙන එව න පඤ් තායතී. වෙමජ්ක්ඛෙව සත්තා සංකමන්ති. එම
24. without beginning or end - 1345 Dictionary
25. බලන්න P. T. S. Dictionary
26. ඒ. කේ. වොර්ඩර්ගේ ඉහත සඳහන් කෘතිය 150 පිටුව
27. ඉහත සඳහන් කළ ජයතිලක කෘතිය 475 පිටුව
28. අවර යන්නෙහි "පහත" "යට" යන අරුත් ඇත. බලන්න Monier Williams - Sanskrt English Dictionary
29. ඒ. කේ. වොර්ඩගේ ඉහත සඳහන් කෘතිය 151 පිටුව
30. උප්පදාවා තථාගතානං අනුප්පාදවා තථාගතං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්ම නියාමතා යදිදං ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදො - සං. නි. II 94, 96 පිටු.
31. විනය 13 - 14 පිටු